සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**10 ශ්‍රේණිය**

**ශිල්ප කලා - I පත්‍රය**

කාලය පැය එකකි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

(01) පතල් කවි, ලී කෙලි, පිත්තල කර්මාන්තය පිළිවෙලින් අයත් වන්නේ කුමන කාණ්ඩයටද?

1) ශ්‍රව්‍ය කලා, දෘශ්‍ය කලා, ශ්‍රව්‍ය දෘශ්‍ය කලා
2) ශ්‍රව්‍ය කලා, ශ්‍රව්‍ය දෘශ්‍ය කලා, දෘශ්‍ය කලා
3) ශ්‍රව්‍ය දෘශ්‍ය කලා, ශ්‍රව්‍ය කලා, දෘශ්‍ය කලා
4) දෘශ්‍ය කලා, ශ්‍රව්‍ය දෘශ්‍ය කලා, ශ්‍රව්‍ය කලා

(02) පියපුතු උරුමයෙන් පාරම්පරිකව පැවත එන, රත් කර වියළි තල් කොළයකින් පිරිමැද නිය පොතු ආධාරයෙන් රටා අඳින කර්මාන්තය කුමක්ද?

1) පේෂ කර්මාන්තය 2) ලාක්ෂා කර්මාන්තය 3) පන් කර්මාන්තය 4) බීරළු කර්මාන්තය

(03) වෙස් මුහුණු කර්මාන්තය වඩාත් ප්‍රසිද්ධ කුමන ප්‍රදේශයේද?

1) දකුණු පළාතේ අම්බලන්තොටය.
2) දකුණු පළාතේ හම්බන්තොටය.
3) දකුණු පළාතේ අම්බලන්ගොඩය.
4) මාතර දිස්ත්‍රික්කයේය.

(04) සාම්ප්‍රදායිකව ලාක්ෂා කර්මාන්තය පැවත එන ප්‍රදේශය කුමක්ද?

1) මාතර අගුල් මඩුව 2) මාතලේ අළුවිහාරය 3) මහනුවර පල්ලෙකැලේ 4) නුවරඑළිය කළුකැලේ

(05) ලාක්ෂා කෘමීන් ජීවත් වන ශාකයක් වන්නේ මින් කුමක්ද?

1) දාස් පෙතියා 2) තල 3) කොහොඹ 4) කෝන්

(06) පරිසර හිතකාමී පන් පැදුරු කර්මාන්තය සඳහා වඩාත් ප්‍රසිද්ධියක් උසුලන්නේ කුමන ප්‍රදේශයද?

1) දුම්බර 2) අක්මීමන 3) අංකුඹුර 4) ගල්ඔය

(07) අතීතයේ ලෝකුරුවන් ලෙස හැඳින්වූයේ

1) ලෝහ භාණ්ඩ නිෂ්පාදකයින්ය 2) රන් කරුවන්ය
3) පතල් කරුවන්ය 4) පිත්තල කාර්මිකයන්ය

(08) දකුණු පළාතේ මුහුදුබඩ ප්‍රදේශයේ ගෘහ කර්මාන්තයක් ලෙස පවතින්නේ මින් කුමක්ද?

1) වෙස් මුහුණු කර්මාන්තය 2) පන් කර්මාන්තය
3) බීරළු කර්මාන්තය 4) මැටි කර්මාන්තය

(09) විහිත චතුරස්‍ර යුගලයේ එක් විහිත චතුරස්‍රයක් සම ද්විපාද ත්‍රිකෝණයක් වේ. එහි කෝණික අගයන් වන්නේ

1) $40^0$ ,$60^0$ , $90^0$ 2) $45^0$ , $45^0$ , $90^0$ 3) $45^0$ , $60^0$ , $90^0$ 4) $60^0$ , $60^0$ , $90^0$

(10) වෘත්ත ඇඳීම, චාප ඇඳීම, වක්‍ර රේඛා ඇඳීම සඳහා භාවිත කරන උපකරණය වන්නේ

1) කෝදුව 2) කෝණමානය 3) කවකටුව 4) බෙදුම් කටුව

(11) ජාත්‍යන්තරව සම්මත වූ කඩදාසි වර්ගීකරණයේ දී A5 කඩදාසියක දිග පළල වන්නේ

1) 148×210 2) 210×297 3) 297×420 4) 420×594

(12) රේඛා වර්ග ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එනම්


1) සිරස් රේඛා , තිරස් රේඛා 2) තිරස් රේඛා , ආනත රේඛා

3) සරල රේඛා , වක්‍ර රේඛා 4) වක්‍ර රේඛා , තිරස් රේඛා

(13) වස්තුවක පෙනෙන දාර දැක්වීම සඳහා යොදා ගන්නා රේඛා වර්ගය වන්නේ

1) සිහින් දාම රේඛා 2) කඩ රේඛා 3) සිහින් අඛණ්ඩ රේඛා 4) ඝණ අඛණ්ඩ රේඛා

(14) වෘත්ත ආශ්‍රිත නිර්මාණ වලදී මෙහි දැක්වෙන රූපය හැඳින්වෙන්නේ කිනම් නමකින්ද?




1) වෘත්ත ඛණ්ඩය

2) කේන්ද්‍රික ඛණ්ඩය

3) වෘත්ත පාදය

4) අර්ධ වෘත්තය

(15) මෙහි දැක්වෙන්නේ විෂම පාද ත්‍රිකෝණයක් වන අතර ඒ පිළිබඳ නිවැරදි හැඳින්වීම වන්නේ




1) ඍජුකෝණි විෂමපාද ත්‍රිකෝණයකි

2) සුළුකෝණි විෂමපාද ත්‍රිකෝණයකි

3) මහාකෝණි විෂමපාද ත්‍රිකෝණයකි

4) සමකෝණි ත්‍රිකෝණයකි

(16) මින් මූලික ඝන වස්තු වලට අයත් නොවන්නේ කුමක්ද?

1) ප්‍රිස්මය 2) පිරමීඩය 3) කේතුව 4) ත්‍රිකෝණය

(17) රෙද්දක තෝරාගත් ප්‍රදේශයන්හි බාහිර උපකරණයක් මගින් සායම් ගැල්වීම හඳුන්වනුයේ

1) මුද්‍රණය යනුවෙනි 2) සායම් පෙවීම යනුවෙනි

3) සායම් ආලේපනය යනුවෙනි 4) නිමාව යනුවෙනි

(18) ස්වාභාවික සායම් භාවිතය වර්ථමානය වන විට අඩු වෙමින් පවතින අතර ඊට හේතු වී ඇති සාධකයක් නොවන්නේ

1) ශාකයන්හි මල් ගෙඩි හට ගැනීම ඍතු අනුව සිදුවීම

2) සායම් කල් තබා ගැනීමේ ක්‍රමවේද නොතිබීම

3) ස්වාභාවික වර්ණ රෙදි වලට අවශෝෂණය නොවීම

4) නිෂ්පාදනය ප්‍රමාණවත් නොවීම

(19) මූලික වර්ණයක් ඒ අසලම ඇති ද්වීතියික වර්ණයක් හා මුසු වීමෙන් තෘතීය වර්ණ බිහි කර ගත හැකිය. පහත වර්ණ අතර තෘතික වර්ණයක් නොවන්නේ මින් කුමක්ද?

1) නිල් , කහ , රතු 2) රතු , දම් 3) නිල් , දම් 4) කහ , කොළ

(20) කැඳ හරණ ක්‍රියාවලියේදී ජලයේ පෙඟවීම සඳහා ජලයට යෙදිය යුතු උෂ්ණත්වය වන්නේ

1) $40^0$C කි 2) $60^0$C කි 3) $80^0$C කි 4) $90^0$C කි

(21) පෙර පිරියම් ක්‍රම වලදී මළ හරණය යනුවෙන් සිදු කෙරෙන්නේ රෙද්දෙහි ඇති

1) විෂජබී ඉවත් කිරීමයි 2) අපද්‍රව්‍ය ඉවත් කිරීමයි

3) කැඳ ඉවත් කිරීමයි 4) සුදු කිරීමයි

(22) ජම්බොයින් නැමැති රසායනික ද්‍රව්‍යයෙන් සකස් වී ඇත්තේ කුමන කෙඳිවල ව්‍යුහයද?

1) ශාක කෙඳි 2) සත්ත්ව කෙඳි 3) ඛණිජ කෙඳි 4) සේද කෙඳි

(23) සායම් ස්ථිර කිරීමේ පසු පිරියම් ක්‍රමයක් ලෙස පන්ති කාමරය තුළ කළ හැකි පහසුම ක්‍රමය කුමක්ද?

1) හුමාලකරණයෙන් පසු සේදීම 2) පවනේ වේලීම

3) තද උෂ්ණත්වයකින් මැදීම 4) වියළි හුමාලය තුළින් ගමන් කරවීම

(24) සියුම් නිමා පින්සල් සම්බන්ධව නොගැලපෙන පිළිතුර තෝරන්න

1) පින්සල්හි කෙඳි කොටස අග තුඩක් ආකාරයට නිමවා ඇත.

2) සියුම් ඉරි, ඉරිරේඛා, තිත් ඇඳීමට සුදුසුය.

3) නොම්මර 4 - 9 දක්වා අංක වලින් යුතුය.

4) අංක 00 - 03 දක්වා අංක වලින් යුතුය.

(25) පෙහෙකම් කෙඳි අතර ප්‍රෝටීන් කෙඳි වර්ගය කුමක්දැයි පහත කෙඳි වලින් තෝරන්න

1) කපු 2) ලිනන් 3) සේද 4) ඇස්බැස්ටෝස්

(26) ස්වාභාවික කෙඳි අතර පත්‍ර වලින් කෙඳි ලබා ගන්නා බාණ්ඩය තෝරන්න

1) කපු , හණ 2) ජූට් , පෛනා 3) නියඳ , සිසල් 4) හණ , නියඳ

(27) ලෝකයේ රෙදි නිෂ්පාදනයෙන් 75%ක් පමණ කපු රෙදි වන අතර ඉන් ඉතාම උසස් කපු වර්ගය කුමක්ද?

1) ඇමරිකන් උස්බිම් කපු 2) සී අයිලන්ඩ් කපු 3) මිසර කපු 4) පීලර් කපු


(28) ලෝම ලබා ගන්නා සතුන් අතර ඔටු පවුලට අයත් සතා මින් කවරෙක්ද?

1) එළුවා 2) ලාමා 3) විකුණා 4) ඇල්පකා

(29) තාපයට ඔරොත්තු දීම හා ගිනි නොගැනීම වැනි විශේෂතා නිසා කාර්මික කටයුතු සඳහා අවශ්‍ය රෙදිපිළි නිපදවීමට යොදා ගන්නේ

1) ශාක කෙඳිය 2) ඛණිජ කෙඳිය 3) සත්ත්ව කෙඳිය 4) ප්‍රෝටීන් කෙඳිය

(30) රූපයේ පරිදි හරස්කඩ හා දික්කඩ පෙනුමක් ඇති කෙඳි වර්ගය තෝරන්න



1) ලෝම

2) සේද


3) ප්ලැක්ස්

4) සාමාන්‍ය කපු

(31) හැඩ පෙති ආධාරයෙන් පටි ගෙතීමේදී ඒ සඳහා හැඩ පෙති සකසා ගත යුතුය. හැඩ පෙති සකසා ගත යුතු මාධ්‍යය මින් කුමක්ද?

1) $A_4$ කඩදාසි 2) ඕමයි කඩදාසි 3) ඝන කඩදාසි 4) ක්‍රේප් කඩදාසි

(32) රූපයේ දැක්වෙන වියමන් රටාව වන්නේ



1) හරස්දාර

2) දික්දාර

3) ජටා

4) චාම්

(33) ප්‍රාථමික මැටි පිළිබඳව නිවැරදි වැකිය ඇතුලත් පිළිතුර තෝරන්න

1) නිර්මාණය වූ ස්ථානයේම තැන්පත් වේ, රතු දුඹුරු කළු වැනි වර්ණ ගනී

2) පැහැයෙන් සුදු වර්ණයක් ගනී, නම්‍යතාවයෙන් අඩුය

3) ශේෂ මැටි, පිහිටි මැටි යන නම් වලින් හැඳින්වේ, සුවිකාර්යතාවය ඉහළ මට්ටමක පවතී

4) ස්වාභාවිකව ප්‍රවාහණය වී වෙනත් ස්ථානයක තැන්පත් වේ, උළු ගඩොල් නිෂ්පාදනයට යොදා ගනී

(34) පහත මැටි අතර ද්විතියික මැටි වර්ගයක් නොවන්නේ මින් කුමක්ද?

1) රතු මැටි 2) කෙඔලින් 3) ගිනි මැටි 4) බෝල මැටි

(35) කොළඹ දිස්ත්‍රික්කයේ බොරලැස්ගමුව ප්‍රදේශයේ ඇති මැටි නිධිය වන්නේ

1) රතු මැටි 2) ගිනි මැටි 3) බෝල මැටි 4) කෙඔලින්

(36) මැටි භාණ්ඩ නිෂ්පාදනයට යොදා ගන්නා අමු ද්‍රව්‍ය අතර නොඇලෙන සුළු අමු ද්‍රව්‍යයක් වන්නේ

1) බෝල මැටි 2) රතු මැටි 3) බෙන්තොනයිට් 4) ඩොලමයිට්

(37) දරණු මගින් මැටි භාණ්ඩ තැනීමේදී දරණු එකිනෙක අලවා ගැනීමට යොදා ගන්නේ

1) ග්‍රොග් 2) හීන්ගිරි 3) ක්වාට්ස් 4) ෆෙල්ඩ්ස්පාර්

(38) පැච්වර්ක් නිර්මාණ සඳහා වඩාත් සුදුසු රෙදි වන්නේ

1) අමු රෙදි, මුද්‍රිත හා තනි පාට කපු රෙදි 2) රැන්ග්ලර් රෙදි

3) අමුරෙදි හා විස්කෝස් රෙදි 4) කපු රෙදි, රැන්ග්ලර් රෙදි

(39) තුඩ මොට ඉදිකටුවක් භාවිතා කරන්නේ කුමන රෙදි වල මැසීම සඳහාද?

1) ටෙට්‍රන් රෙදිවල  2) අයිඩා රෙදිවල  3) ෆෙල්ට් රෙදිවල  4) පොලියෙස්ටර් රෙදිවල

(40) රිබන් එම්බ්‍රොයිඩර් සඳහා වඩාත් සුදුසු රෙදි වර්ගය මින් කුමක්ද?

1) විස්කෝස්  2) රෙයෝන්  3) ලිනන්  4) නයිලෝන්

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**10 ශ්‍රේණිය**

**ශිල්ප කලා - II පත්‍රය**

කාලය පැය දෙකකි

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.

(01)

1) ලාංකීය සිව්සැට කලාව බෙදා දක්වන ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න

2) ශ්‍රී ලංකාවේ මැටි නිධි ස්ථාන ගත ව ඇති ප්‍රදේශ 02ක් ලියන්න

3) ලාක්‍ෂා කෙඳි උපයෝගී කොට අලංකාර කරන භාණ්ඩ 02ක් ලියන්න

4) නාට්‍ය රංගනයේදී විවිධ චරිත හඳුන්වා දීමට යොදා ගෙන ඇති වෙස් මුහුණු 02ක් ලියන්න

5) පන් කර්මාන්තය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය 02ක් ලියන්න

6) පිත්තල භාණ්ඩ සඳහා වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශය නම් කරන්න

7) බීරළු කර්මාන්තය ලාංකීය කතට උරුම වූයේ කිනම් රටකින්ද?

8) පිත්තල පහනක ආකෘතියක් අඳින්න

9) පැච්වර්ක් නිර්මාණයක හැඩතලයක් අඳින්න

10) උත්සව අවස්ථාවක සැරසිලි සඳහා යොදා ගත හැකි මල් වර්ග 02ක් ලියන්න

(10 × 2 = 20)

(02)

1) ජ්‍යාමිතික ඇඳීම ප්‍රධාන ආකාර දෙකක් වේ. ඒ මොනවාද? (ලකුණු 2)

2) වෘත්තයක් ඇඳ වෘත්ත ඛණ්ඩය, විශ්කම්භය, ජ්‍යාය ඇඳ දක්වන්න (ලකුණු 3)

3) 5cm දිග සරල රේඛාවක් ඇඳ සමාන කොටස් 4කට බෙදා දක්වන්න. (ජ්‍යාමිතිකව නිර්මාණය කළ යුතුය) (ලකුණු 5)

(03)

1) අතීත මුතුන් මිත්තන් සිතුවම් ඇඳීමට නූල් වර්ණ ගැන්වීමට භාවිතා කළ පාරිසරික අමුද්‍රව්‍ය 2ක් ලියන්න (ලකුණු 2)

2) ද්විතියික වර්ණ ලෙස වර්ණාවලියේ ඇති වර්ණ මොනවාද? (ලකුණු 3)

3) අච්චු භාවිතයෙන් කොට්ට උරයක් අලංකාර කර ගන්නා ආකාරය විස්තර කරන්න (ලකුණු 5)

(04)

1) ස්වාභාවික කෙඳි අතර ශාක කෙඳි වර්ග 04ක් ලියන්න (ලකුණු 2)

2) සේද කෙඳි ලබා ගන්නා පට පනු වර්ග 03ක් ලියා ඔවුන් ආහාරයට ගන්නා කොළ වර්ග ලියන්න (ලකුණු 3)

3) චාම් වියමනේ ප්‍රභේද 4ක් ලියා ඉන් දෙකක් රූප සටහන් මගින් දක්වන්න (වියමන් රටාව) (ලකුණු 5)

(05)

1) ප්‍රාථමික මැටි භාවිතයෙන් කරන නිෂ්පාදන 02ක් ලියන්න (ලකුණු 2)

2) මැටි නිධි පිහිටි ස්ථානය අනුව ඒවා කලාප 03කට බෙදා දැක්විය හැකිය. ඒ මොනවාද? (ලකුණු 3)

3) මැටි දරණු භාවිතයෙන් කුඩා බඳුනක් සකස් කර ගන්නා අයුරු පැහැදිලි කරන්න (ලකුණු 5)

(06)

1) විසිතුරු මැහුම් ක්‍රම 2ක් ලියන්න (ලකුණු 2)

2) රිබන් හා මැහුම් ක්‍රම භාවිතයෙන් කළ හැකි නිර්මාණයක් සඳහා කටු සටහනක් අඳින්න (ලකුණු 3)

3) මැටි තහඩු භාවිතයෙන් භාණ්ඩයක් සාදන අයුරු විස්තර කරන්න (ලකුණු 5)

(07) මාතෘකා 02ක් සඳහා කෙටි සටහන් ලියන්න

1) හණ කෙඳි

2) ආර්ද්‍රතාවය

3) බෝල මැටි

4) ග්‍රාමීය කර්මාන්ත

(5 × 2 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

10 ශ්‍රේණිය

ශිල්ප කලා - පිළිතුරු පත්‍රය

### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| (01) | 2 |
| (02) | 2 |
| (03) | 3 |
| (04) | 1 |
| (05) | 4 |
| (06) | 1 |
| (07) | 4 |
| (08) | 3 |
| (09) | 2 |
| (10) | 3 |
| (11) | 1 |
| (12) | 3 |
| (13) | 4 |
| (14) | 2 |
| (15) | 1 |
| (16) | 4 |
| (17) | 3 |
| (18) | 3 |
| (19) | 1 |
| (20) | 2 |
| (21) | 2 |
| (22) | 4 |
| (23) | 2 |
| (24) | 3 |
| (25) | 3 |
| (26) | 2 |
| (27) | 2 |
| (28) | 1 |
| (29) | 2 |
| (30) | 4 |
| (31) | 3 |

| | |
|---|---|
| (32) | 1 |
| (33) | 2 |
| (34) | 2 |
| (35) | 4 |
| (36) | 4 |
| (37) | 2 |
| (38) | 1 |
| (39) | 2 |
| (40) | 3 |

## II කොටස

(01)

1) ජන කලාව , විදග්ධ කලාව
2) කැළණිය , මොලගොඩ කළුතර
3) කුඩා මංජුසා , සැරයටි , සේසත් මිටි , උඩැක්කි , වටාපත් මිටි , යෂ්ටි , බීරළු
4) රජ බිසව , රාජ වෙස් මුහුණු , මනමේ බිසව , ගිරිදේවි , නාග රාජ , නාග කුමරා
5) ගල්ලැහැ , වැටකෙයියා , දුනුකෙයියා , තුන්හිරියා , තල් කොළ , ඉඳි කොළ ආදිය
6) මහනුවර පිළිමතලාව
7) ලන්දේසින්ගෙනි
8) ඇඳ ඇති නිර්මාණය නිවැරදි නම් ලකුණු ලබා දෙන්න
9) නිවැරදිව ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න
10) ඇන්තූරියම් , ඕකිඩ් වැනි මල් වර්ග ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

(02)

1) තල ජ්‍යාමිතිය , ඝන ජ්‍යාමිතිය
2) නිවැරදිව වෘත්තයක් ඇඳ, දී ඇති කොටස් ලකුණු කර ඇත්නම් ලකුණු ලබා දෙන්න
3) නිර්මාණාත්මකව කොටස්වලට බෙදා ඇත්නම් ලකුණු ලබා දෙන්න

(03)

1) ගස්වල පොතු , පත්‍ර , කිරි , අල වර්ග (රයිසෝම) , මැටි වර්ග , ශාක තෙල් වර්ග , සත්ත්ව තෙල් වර්ග , හිරිගල්
2) ද්විතියික වර්ණ - දම් වර්ණය , කොළ වර්ණය , තැඹිලි වර්ණය
3) ලියා ඇති පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න

(04)

1) කපු , හණ , නියඳ , රැමි , පෙයිනා , මැනිලා , සිසල් , ජූට්

2) මල්බෙරි පටපනුවා - මල්බෙරි කොළ

ඊරි පටපනුවා - එරඬු කොළ

ඕක් පටපනුවා - ඕක් කොළ

3) වියමන් රටා 02ක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න

(05)

1) පෝසිලේන් භාණ්ඩ , සෙරමික් භාණ්ඩ , දන්තාලේප බෙහෙත් දවටන , තීන්ත , පරිවාරක උපකරණ , පොහොර

2) තෙත් කලාපීය මැටි නිධි

වියළි කලාපීය මැටි නිධි

අන්තර් කලාපීය මැටි නිධි

3) ලියා ඇති පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න

(06)

1) දම්වැල් මැස්ම , ලේසි ඩේසි මැස්ම , හුරුළු කටු මැස්ම , බ්ලැන්කට් මැස්ම , ප්‍රංශ ගැට මැස්ම

2) ඇඳ ඇති රූපසටහන අනුව ලකුණු දෙන්න

3) ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න

(07) 10 ශ්‍රේණිය ශිල්ප කලා පෙළ පොතෙහි 71 , 100 , 110 , 114 පිටු බලන්න